දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 36/2010

මගේ අංකය: බ/13/06.
බන්ධනාගාර මූලස්ථානය.
කොළඹ 09.
2010-12-03

බන්ධනාගාර කොමසාරිස්වරුන්,
සියළුම මාණ්ඩලික නිලධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ,
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

***2010 මුදල් වර්ෂය සඳහා වූ ගිණුම් පියවීම -***
***බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුම.***

2010-12-31 වන දිනෙන් අවසන් වන ගිණුම් වර්ෂය සඳහා ගිණුම් පියවීම සම්බන්ධයෙන් පහත සඳහන් උපදෙස් හා නියෝග පිළිපදින ලෙස දන්වමි.

*02.* (I) 2010 වර්ෂයේ ගිණුම් පියවීම සම්බන්ධයෙන් අංක 21/2005 දරණ දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙන් දෙන ලද සියළුම උපදෙස් ඔබ ආයතනයට අදාල බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් ද අදාල වන බව මෙයින් දන්වමි. මෙම උපදෙස් අනුව සැපයුම් හා සේවා සම්බන්ධයෙන් මුදල් ගෙවීම, සුළු අක්මුදල් පියවීම, ආදිය කළ යුතු අතර, බැංකු සැසඳුම් ප්‍රකාශය කර්මාන්ත ගිණුම් සාරාංශ ආදී ප්‍රකාශන මූලස්ථානය වෙත එවිය යුතුය.

(II) ඉහත ගිණුම යටතේ ඔබ වෙත වෙන්කර දී ඇති අක් මුදල් ගෙවීම් කිරීමෙන් පසු 2010-12-31 දිනට ඇති ශේෂය " බන්ධනාගාර කොමසාරිස් කර්මාන්ත" නමින් ලියන ලද චෙක්පතකින් බන්ධනාගාර මූලස්ථානයට එවිය යුතුය. 2011 වර්ෂය වෙනුවෙන් අදාල වන වියදම් සඳහා අක්මුදල් හා ප්‍රතිපාදන යථා කාලයේදී වෙන්කර දෙනු ඇත.

***03. රජයේ බිල්පත්.***

සියළුම රජයේ බිල්පත් 2010-12-31 දිනට පෙර (මීට අදාල චක්‍රලේඛ උපදෙස් අනුව) මූලස්ථානයට ඉදිරිපත් කරන්න. මූලස්ථාන පොත් සමග සසඳා ගත යුතු බැවින්, මෙම බිල්පත් වර්ගීකරණ විස්තර නියමිත දිනට පෙර අනිවාර්යයෙන්ම ඉදිරිපත් කිරීමට පියවර ගන්න. භාණ්ඩ හා සැපයුම් සඳහා වන ඇණවුම් භාර ගැනීම 2010-12-20 දිනෙන් අවසන් කල යුතු අතර, ඊට පසු කිසිම ඇණවුමක් භාර නොගැනීමට වග බලා ගන්න. 2010-11-30 දිනට අවසන් මාස 11 සියළුම බිල්පත් වල සාරාංශයන් 2010-12-10 වෙනි දිනට පෙර මූලස්ථානය වෙත යොමු කරන්න.

2010 වර්ෂයේ සම්පූර්ණ විකුණුම් හා ඒ සඳහා වූ බිල්පත්වලට අදාල වර්ගීකරණය කලයුතු අතර, 2010 නොවැම්බර් 30 දක්වා වූ විකුණුම් වෙනුවෙන් අදාල වර්ගීකරණය 2010-12-08 දිනටත් 2010 දෙසැම්බර් මාසය සඳහා වූ බිල්පත් වර්ගීකරණය 2011-01-10 දිනට හෝ ඊට ප්‍රථම ඉදිරිපත් කලයුතු වේ.

*<u>පුද්ගලික බිල්පත්.</u>*

ඉහත පරිදි කටයුතු කළ යුතු අතර, අත්පිට මුදලට විකුණුම් වන බැවින්, මුළු පුද්ගලික බිල්පත්වල එකතුව මුදල් පොතේ බැර කිරීම් වලට සමාන විය යුතුය. අංශ අනුව පුද්ගලික බිල්පත් වල "ආ" මිළ විස්තරය හිසි පරිදි පිළියෙල කොට 2011-01-10 දිනට පෙර මූලස්ථානයට ඉදිරිපත් කර අවසන් කල යුතුවේ. 2010-11-30 දිනට අවසන් මාස 11 සියළුම බිල්පත් වල සාරාංශයන් 2010-12-08 වෙනි දිනට පෙර මූලස්ථානය වෙත යොමු කරන්න.

*04. <u>රජයේ හා පුද්ගලික කර්මාන්ත හා අනෙකුත් බිල්පත් නිරවුල් කිරීම.</u>*

බන්ධනාගාර කර්මාන්ත හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමට නිරවුල් කළ යුතු රජයේ බිල්පත් නිරවුල් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙතින් වහාම ලබා ගෙන නිරවුල් කල යුතුය. සියළුම නිරවුල් කිරීම් චෙක්පත් මගින් හා 2010-12-24 වන දින තෙක් පමණක් ක්‍රියාත්මක න පරිදි හරස් සටහන් මගින් සිදුකර 2011-01-05 වන දිනට පෙර මූලස්ථානය වෙත එවිය යුතුය. හරස් සටහන් මගින් බිල්පත් නිරවුල් කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබිය යුතු අතර, ප්‍රතිපාදන ඔබවෙත නොමැතිව කරන ලද නිරවුල් කිරීම් වෙනුවෙන් විගණන විමසුම් වලට ඉඩ නොතබන ලෙසත්, එසේ සිදුවුව හොත් එම වගකීම ඔබට භාර කරමි. මෙසේ හරස් සටහන් මගින් නිරවුල් කරන ලද කර්මාන්ත බිල්පත් පිළිබඳ විස්තර, සහකාර කොමසාරිස් (මුදල්) වෙත අනිවාර්යයෙන්ම ඉදිරිපත් කල යුතුය.

*05. <u>කාර්මාන්ත හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමේ අවසාන ගිණුම් වාර්තාව.</u>*

ඉහත දක්වා ඇති කරුණු සැලකිල්ලට ගෙන ගිණුම් පියවීමේ කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව කර්මාන්ත හා කෘෂිකාර්මික අවසාන ගිණුම් වාර්ථා ද සකස් කර 2011-01-25 දිනට පෙර මූලස්ථානයට එවීමට ඔබේ පෞද්ගලික අවධානය යොමු කරවන ලෙස දන්වමි. ප්‍රමාද වී අවසන් ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම නිතර නිතරම විගණන විමසුම් වලට ලක්වන හෙයින්, මෙම වර්ෂයේ නියමිත දිනට පෙර මෙම ගිණුම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ. තවද, තොගවල අගය ගිණුම් වල ඇතුලත් කිරීමේ කාර්යන් සඳහා 2010-12-31 වන දිනට අතැති (නිමි හා නොනිමි) තොග, භෞතික සත්‍යාපන පිරික්සුමට භාජනය කර අදාල මිල අනුව ගණනය කර, වාර්ෂික ගිණුම සමග ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර, එසේම කටයුතු සිදුකල බවට බන්ධනාගාර අධිකාරී විසින් සහතික කල යුතුය. එසේම කර්මාන්ත හා කෘෂිකර්මික කාර්යයන් සම්බන්ධ කටයුතු කරන නිළධාරින්ගේ වැටුප් අතිකාල වැනි සියළුම ගෙවීම්, එනම් 2010 වර්ෂයට ගෙවූ එක් එක් වැය ශීර්ෂය යටතේ විස්තර (කල්පිත ගාස්තු) ගිණුම් සමග ඉදිරිපත් කිරීමට ද කටයුතු කරන ලෙස දන්වමි.

*06. <u>සත්වයින්ගේ අගය.</u>*

සත්ව පාලන අංශ ඇති ආයතන අධිකාරී විසින් චක්‍රලේඛ අංක 63/79 අනුව 2010-12-31 වන දිනට සිටින සත්වයින්ගේ වටිනාකම දැක්වෙන සහතිකයක් ලබාගෙන ගොණුකර තබා ගත යුතුය. මෙම සහතිකය 2010 වර්ෂයේ කර්මාන්ත හා කෘෂිකාර්මික අවසන් ගිණුම් වාර්තාව සමග මූලස්ථානය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

*07. පසුගිය වසරේ විගණකාධිපති විසින් පෙන්වා දී ඇති අඩුපාඩු සම්පූර්ණ කිරීම.*

07:1 2010-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුරේ 502(2) අනුව අත්තිකාරම් කටයුත්ත සඳහා පාවිච්චියට ගනුලැබූ ස්ථාවර වත්කම් වෙනුවෙන් ලේඛණ පවත්වා තිබිය යුතු අතර, අදාල වර්ෂය තුලදී එක් එක් අංශ යටතේ පාවිච්චියට ගනු ලැබූ ස්ථාවර වත්කම්, ඒවායේ වටිනාකම් හා එක් එක් ස්ථාවර වත්කම් වල ක්‍ෂය වීටි ගණනය ඇතුලු තොරතුරු ඉදිරිපත් කල යුතුය.

07:2 මු.රේ 505 අනුව සෑම මසකට වරක් අත්තිකාරම් කටයුත්ත සඳහා පාවිච්චියට ගනුලබන තොග බඩු භෞතික සත්‍යාපනයට ලක්කල යුතු අතර එම සමීක්‍ෂණ වාර්තා අත්තිකාරම් ගිණුම් අංශයට මාසිකව ලබාදීමට කටයුතු කලයුතුවේ.

07:3 කල්පිත ගාස්තු විස්තරාත්මකව ලැයිස්තු සහිතව සහ ප්‍රභව තොරතුරු නිවැරදිව දැක්විය යුතුය. කල්පිත ගාස්තු ඇතුලත් කිරීම අවම කරගැනීමටත් සත්‍ය තොරතුරු ගිණුම් වල ඇතුලත් කිරීමටත් කටයුතු කලයුතු වේ. තවද, සත්‍ය තොරතුරු ලබා ගැනීමට අපහසු අවස්ථාවලදී අනුපාතය සහ ප්‍රතිශතයන් සැලකිල්ලට ගෙන ගිණුම් ගත කලයුතුය.

07:4 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 147(1) අනුව පුද්ගලික අංශයට කරනු ලබන විකුණුම්වලට අයකල යුතු දෙපාර්තමේන්තු සේවා සම්පාදනය සඳහා වූ පරිපාලනමය ගාස්තු අයකරගත යුතු වේ.

07:5 වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් අනුව 2010 වසරේ කටයුතු කර තිබිය යුතු වේ. ඒ අනුව ඉලක්ක සපුරාගෙන තිබිය යුතුය. වාර්ෂික සැලැස්ම අනුව ඇස්තමේන්තු වියදම හා ආදායම වෙනස් වීමට අදාල පිළිගත හැකි කරුණු ඉදිරිපත් කලයුතු වේ. 2010 ක්‍රියාකාරී සැලැස්ම හා එහි ඉලක්ක සපුරා ගැනීම, වියදම හා ආදායම් ඇස්තමේන්තු වලට අනුරූපව ආදායම් සත්‍ය තත්වය සසඳා අදාල වාර්තාව 2011 ජනවාරි 31 දිනට පෙර බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත එවිය යුතු වේ.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

පිටපත්:- 01. විගණකාධිපති